// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2356/17 – 2023 නොවැම්බර් මස 01 වැනි බදාදා – 2023.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/X/2015/138.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.11.11 දිනැති හා අංක 2149/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රාගම, කැන්දලියද්ද පාළුව, විජයබා මාවත, අංක 705/16 හි පදිංචි එස්. රණසිංහ මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 108/2019 හා 2023.09.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 040644 – 18 (2023/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

යොමු අංකය : IR/Com/03/X/2015/138.
නඩු අංකය : A/108/2019.

එස්. රණසිංහ මයා,
අංක 705/16, විජයබා මාවත,
කැන්දලියද්ද පාළුව,
රාගම.

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

**පෙනී සිටීම**

පළමු පාර්ශ්වය ඉල්ලුම්කරු රණසිංහ මහතා සිය නියෝජිත සරත් රොබට්සන් මහතා සමග ද දෙවන පාර්ශ්වය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරිනී දිමුතු පනංගල මහත්මිය රජයේ නීතිඥ එෆ්. ෆයිස් මහතා සමග පෙනී සිටි අතර 2022.02.09 දින සිට රජයේ නීතිඥ තාරිකා හේවාගේ මහත්මිය හා 2022.12.15 දින සිට හිරුණි සෙනෙවිරත්න මහත්මිය පෙනී සිටී.

**බලතල පැවරීම**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ විධිවිධාන පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල කොහොඹන් වත්ත අංක 66/2 එහි, එච්. ආර්. එල්. සුගතදාස වන මා පත්කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ, "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ III ශ්‍රේණියේ සිවිල් ඉංජිනේරු එස්. රණසිංහ මහතාගේ සේවය 2010.10.25 දින සිට 2011 පෙබරවාරි දක්වා සහ 2011.08.23 සිට 2012.04.25 දින දක්වා අවස්ථා දෙකකදී අඩ වැටුප් සහිතව වැඩ තහනම් කර පසුව නැවත සේවයේ පිහිටුව ද එම වැඩ තහනම් කළ කාලයට නොගෙවූ අඩ වැටුප් හා උසස්වීම් ඇතුලු වෙනත් සහනයක් නොලැබීමත් ඔහුට යම් අසාධාරණයක් සිදුව ඇත්ද ? එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳ වේ.

2020.09.03 දින නඩුව විභාග කිරීම ආරම්භ කළ අතර පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු හා එස්. පී. සිරිපාල මහතා සාක්ෂි ලබාදුන් දෙවන පාර්ශ්වය වෙනුවෙන් නැගෙනහිර කම්කරු කාර්යාලයේ කොළඹ කම්කරු නිලධාරි කුමාර ධම්මික සහ විමර්ශන නිලධාරි ඉන්දික චන්දිමාල් ද සිල්වා සහ නියෝජ්‍ය ආරක්ෂක නිලධාරි ජයසිංහ ආරච්චිගේ ප්‍රසාද්, නියෝජ්‍ය ප්‍රධාන සිවිල් ඉංජිනේරු නිශාන්ත ප්‍රධාන

සිවිල් ඉංජිනේරු චානුක ජයසේකර මහතා සාක්ෂි ලබාදුන් අතර දෙපාර්ශ්වයම ලිඛිත දේශන ඉදිරිපත් කර ඇති අතර පළමු පාර්ශ්වය පළමු සිද්ධියට අදාළ පැ. 1-18 දක්වා ද 2011 සිද්ධිය සම්බන්ධයෙන් A1-A9 ලේඛන සලකුණු කර ඉදිරිපත් කරයි. දෙවන පාර්ශ්වය R1-R42 දක්වා ලේඛන ඉදිරිපත් කර ඇත.

මෙම නඩුව 2020.09.03 විභාගයට ගත් අවස්ථාවේ දෙවන පාර්ශ්වය මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරයි.

2011.08.03 සිට 2012.09.25 කාලයට නොගෙවූ අර්ධ වේතනය ලබාගැනීමට එකග වී කම්කරු දෙපාර්තමේන්තු කරන ලද පැමිණිල්ල ඉල්ලා අස්කර ගෙන ඇති බැවින් ඒ සම්බන්ධයෙන් බේරුම්කරණය දක්වා පැමිණි ඇති බවත් එකම නඩු නිමිත්තකට නැවත නැවත නඩු පැවරීම රෙස්ජුඩිකාමා ගණයට අයත් වන අතර එය නීත්‍යානුකූල නොවන නිසා ඇතිකරගන්නා ලද සමථයට පටහැනිව කටයුතු කිරීමක් ද වේ. අදාළ නඩු ගොනුව IR/10/40/2013 වන බව ද කියා සිටී.

පළමු පාර්ශ්වකරු තම අදහස් දක්වමින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ඇමතිතුමා මැදිහත් වී සම්පූර්ණ වැටුප ගෙවීමට එකග වූ නිසා පැමිණිල්ල අස්කර ගත් බවයි. ඉල්ලා අස්කර පසු අඩ වැටුප් ලැබූ බවත් මෙම පැමිණිල්ල ඉදිරිපත් කළේ ඉතිරි අර්ධ වැටුප් ලබා ගැනීමට බවය.

අදාළ කම්කරු දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිල්ලේ සටහන් ඉදිරිපත් කරන ලෙස දෙවන පාර්ශ්වයට උපදෙස් දුන් අතර මූලික විරෝධතාව පිළිබඳ නියෝගය ලබාදීම 2020.09.24 දිනට කල් තබන ලදී.

2020.09.24 දෙවන පාර්ශ්වය අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට දිනයක් ඉල්ලා සිටී. ඒ අනුව අවසාන වශයෙන් 2020.10.29 දිනය ලබා දුනි.

සමථකරන පිළිබඳ හෝ සමථය වූ බවට කරුණු ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශ්වයට නොහැකි වී බැවින් පැමිණිල්ලේ සාක්ෂි මෙහෙයවීමට පළමු පාර්ශ්වයට උපදෙස් දුන් අතර නඩුව අතර මග ඒ පිළිබඳ කරුණ දැක්වුවහොත් මූලික විරෝධතාවය පිළිබඳ තීරණයක් දෙන බවට මෙහිදී දෙපාර්ශ්වයට දැනුම් දී නඩුව විභාග කිරීමට තීරණය කළෙමි.

ඒ අනුව පළමු පාර්ශ්වය සාක්ෂි ලබාදුන් අතර දෙවන පාර්ශ්වය ද සාක්ෂි ලබාදුන් පසු ලිඛිත දේශන ගොනු කරන ලෙස දෙපාර්ශ්වයටම උපදෙස් දුනිමි. දෙපාර්ශ්වයම සිය ලිඛිත දේශන ගොනු කර ඇත. දෙවන පාර්ශ්වය 2023.09.17 දින අමතර ලිඛිත දේශන ගොනු කර ඇත. කරුණු දැක්වීම අවසන් වූ පසු ලිඛිත දේශන ඉදිරිපත් විය. දෙපාර්ශ්වයට උපදෙස් දෙන ලද පරිදි දෙපාර්ශ්වමය සිය ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත.

දෙවන පාර්ශ්වය සිය ලිඛිත දේශන ගොනු කරමින් පළමු පාර්ශ්වයේ ස්ථාවරය හා සිද්ධිමය පසුබිම හා නීතිමය පසුබිම යටතේ කරුණු දක්වා ඇත.

නීතිමය පසුබිම යටතේ කරුණු දක්වමින් පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය අතර සජීවි ආරාවුලක් නොමැති අතර එකී නෛතික පදනම ප්‍රකාරව පළමු පාර්ශ්වයට මෙම ගරු බේරුම්කරණයෙන් අධිකරණය සහන ලබා ගැනීමට අධිකරණ බලයක් නොමැති බව සඳහන් කර ඇත. මේ සම්බන්ධ Sumith Adihetti V Mercantile Investment and others නඩු තීන්දු The state Bank of India V Sundaralingam (1971) 73 NLR 514 නඩු පිළිබඳව සහ මෑතදී බේරුම්කරණය විසින් දෙන ලද තීරණ ඉදිරිපත් කර ඇත.

මෙම විරෝධතාව එනම් නීතිමය පසුබිම හා සජීවි ආරාවුලක් නොමැති බවට ගෙන එන ලද තර්කය නඩුව ආරම්භයේ දී ඉදිරිපත් කළ යුතුව තිබුණි. මෙම කාරණය මෙම නඩුව අවසානයේ ඉදිරිපත් කිරීමෙන් පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදුවේ.

දෙවන පාර්ශ්වය එම නඩු තීන්දුවලදී ගරු විනිසුරුතුමන්ලා විසින් දෙන ලද අර්ථ නිරූපණයන් දක්වමින් විශ්‍රාම ගොස් ඇති සේවකයකු හා සේවායෝජකයකු අතර පවතින ආරාවුල සඳහා ප්‍රදානයන් ලබාදීමට කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ ගරු විෂය භාර අමාත්‍යවරයා පත්කරනු ලබන බේරුම්කාරවරයෙක් හට කිසිදු අධිකරණ බලයක් නොමැති බවට දක්වා ඇත.

ඉහත විස්තර අනුව මෙම ආරාවුල සජීවී ආරාවුලක් ද යන්න පිළිබඳ තොරතුරු පළමු පාර්ශ්වයෙන් ලබාගත නොහැකි බැවින් ඉදිරිපත් වූ සටහන් අනුව සජීවී ආරාවුලක් ද යන්න සෙවීමට තීරණය කළෙමි.

මෙම ආරාවුල සම්බන්ධ වැටුප් නොගෙවීම 2010 හා 2012 වර්ෂවලට අදාළ වේ. පළමු පාර්ශ්වකරු 2017.11.28 විශ්‍රාම ගොස් ඇත.

අදාළ විනය නියෝග සම්බන්ධ අතෘප්තියට පත් පළමු පාර්ශ්වකරු කම්කරු කොමසාරිස්වරයා වෙත 2012 වර්ෂයේ පැමිණිලිකර ඇත. ඒ බව දෙවන පාර්ශ්වයක් විසින් ලකුණු කර ඉදිරිපත් කරන ලද R 17 ලේඛනයෙන් හා කම්කරු දෙපාර්තමේන්තුවේ කමල් ධම්මික මහතාගේ සාක්ෂියෙන් සහ පිටු (අංක 68 පිටුව) දක්වූ ඇති දෙපාර්තමේන්තු ලිපිගොනු අංක CE/D/09/5/243/2012 හා CE/D/09/5/369/2012 අනුව තහවුරු වේ. 2015 වර්ෂයේ මෙම ආරාවුල සම්බන්ධ පැමිණිලිකර ඇති බව ගරු කම්කරු අමාත්‍යවරයා බේරුම්කරණ සඳහා යොමුකළ ලිපියේ අංකය IR/Com/C3/X2015/138 අංකයෙන් සහ FR/10/40/293 ලිපි අනුව තහවුරු වේ.

පළමු පාර්ශ්වය විසින් A 9 ලෙස ලකුණු කර ඉදිරිපත් කළ ලංකා ගමනා ගමන මණ්ඩලය නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු සභාපති ශ්‍රී ලංගම වෙත යොමුකර ඇති ලිපිය (පිටු අංක 462) අනුව එනම් ශ්‍රී ලංකා / මාස.ක / කම්.සම් /27/28/2014 ලිපිගොනුවෙන් ද මෙම ආරාවුල සේවකයා විශ්‍රාම යන තෙක් 2017.11.28 දින දක්වාම සජීවීව පැවති බව තහවුරු වේ. දෙපාර්ශ්වය සමථකරණය සඳහා ලිපි හුවමාරු වී ඇති බව තහවුරු වේ. ප්‍රමාදයක් සිදුවූවා නම් එය පළමු පාර්ශ්වයේ ක්‍රියාදාමයෙන් බැහැර වූ සිද්ධි නිසා බව තහවුරු වේ. මේ අනුව සජීවී ආරාවුලක් සේ සලකා කටයුතු කිරීම යුක්ති සහගත හා සාධාරණ බවට තීරණය කරමි.

මෙම නඩුව අවසන් වූ 2023.06.13 දින දක්වාම නඩුවේ හිග වැටුප් පිළිබඳ කරන ලද සමථයන් පිළිබඳ තහවුරු කිරීමට නොහැකි වීම නිසා මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි.

පළමු පාර්ශ්වයේ මූලික ඉල්ලීම නම් 2010/08/23 - 2011/2 දක්වා සහ 2010/11/19 - 2012/04/02 දක්වා අහිමි කරන ලද අඩ වැටුප් නොදීමෙන් හා උසස්වීම් ලබා නොදීමෙන් තමන්ට අසාධාරණය වී ඇති බව එම හිග වැටුප් ලබාදෙන ලෙසත් ය.

2009/12 මස හා 2011/10 මාසවල කරන ලද විෂමාචාර ක්‍රියාවන් නිසා සේවය නතරකොට විනය විභාග පවත්වා සේවය නතර කර තිබූ කාලය වැටුප් අහිමිකර ඇත. අභියාචනා ඉදිරිපත් කර අඩ වැටුප් ලබාගෙන ඇත.

මෙම ඉල්ලීම් පිළිබඳ සලකා බැලීමේ දී විසඳිය යුතු ප්‍රශ්න ලෙස

(1) පළමු පාර්ශ්වකරු විෂමාචාර ක්‍රියාවක් කර තිබේ ද ?
(2) ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් කර ඇත් ද ?
(3) විෂමාචාර සම්බන්ධයෙන් ආයතන විනය නීතිය අනුව කටයුතු කර තිබේ ද ?

පළමු පාර්ශ්වයේ ඉල්ලීම කාල පරිච්ඡේද දෙකකට සම්බන්ධ බැවින් ඒ ඒ සිද්ධියට වෙන වෙනම කරුණු ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුනිමි.

මේ අනුව පළමු පාර්ශ්වකරු සාක්ෂි දෙමින් සභාපතිතුමාගේ පෞද්ගලික සහකාර තුමාගේ වැසිකිළි සඳහා සනීපාරක්‍ෂක උපකරණ සවිකිරීම සඳහා රු. 66,235/- ඇස්තමේන්තු සකස්කර (A(4) R (11) දින 35 පිටු) 2009/12/03 අත්තිකාරම් වශයෙන් රු. 55,000 ලබාගෙන අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා එස්. ඩී. සිරිපාල මහතාට දුන් බව කියා සිටී. තමාගේ නමින් ලබාගත් බව ((37) පිටුව) සඳහන් කරයි. වැඩ ප්‍රමාද වන බව සඳහන් කරමින් සභාපති දැනුවත් කළ බව ද ප්‍රකාශ කරයි. ((41) පිටුව පැ. (7) ලේඛන), එම ලිපියේ 2009/12/08 දින සඳහන් වේ. මෙම මුදලින් (86 පිටු)

2009/12/28 රු. 6800 (R 13 a)
2009/12/25 රු. 3600 (R 13 b)
ඉතිරි මුදල 44,600/ - ක් බවත්,

දෙවන පාර්ශ්වයේ නීතිඥ මහත්මියගේ හරස් ප්‍රශ්නවලට උත්තර දෙමින් ප්‍රකාශ කර ඇත. මෙම ඉතිරි මුදල වර්ෂ අවසානයේ ගිණුම් පියවීම සඳහා ගණකාධිකාරිගේ ඉල්ලීම මත තැන්පත් කරන ලෙස සිරිපාල මහතාට පළමු පාර්ශ්වය උපදෙස් දී ඇති අතර 2009.12.30 දින මුදල තැන්පත් කර ඇත. (46 පිටුව පැ (8)) රජයේ හා ආයතනික මුදල් රෙගුලාසි අනුව ලබාගත් මුදල දින 3ක් ඇතුළත පියවිය යුතු බව දෙවන පාර්ශ්වය නීතිඥ මහත්මියගේ හරස් ප්‍රශ්නවලට උත්තර දෙමින් (37 පිටු) පළමු පාර්ශ්වකරු පිළිගෙන ඇත.

ප්‍ර. මෙම රු. 44,600/- මුදල කොපමණ කාලයක් රඳවාගෙන තිබෙනවා ද ?

උ. දින 27

ප්‍ර. ආයතනයේ මුදල රෙගුලාසි අනුව තමන් සන්තකයේ ස්ථානීය දෙයකට ගත්ත මුදල තබා ගන්න පුළුවන් දින 3ක් නේද ?

උ. ඔව්

මුදල් ගොඩනැගිලි පරිපාලක ළඟ තිබුණ ද මුදල නියමිත දිනට පියවීමේ වගකීම මුදල් ලබාගත් පළමු පාර්ශ්ව සතු වගකීමකි.

මෙම මුදල පියවීම තමන් සතු රාජකාරියක් නොවන බව ගොඩනැගිලි පරිපාලක සිරිපාල මහතා සාක්ෂි දෙමින් පවසා ඇත. (46 පිටුව)

මෙම කරුණු අනුව ආයතනයේ මුදල් නියමිත දිනට පියවීමේ කටයුතු නොකිරීමෙන් පළමු පාර්ශ්වකරු විෂමාචාරයක් සිදුකර ඇති බවට තහවුරු වේ.

2010.11.15 දිනැති චෝදනා පත්‍රයෙන් උපදෙස් පිළිනොපැදීම ගැන චෝදනා නගා ඇත. උපදෙස් නොපිළිපැදීම පිළිබඳ සාක්ෂිවලින් තහවුරු නොවේ.

තුන්වන චෝදනාව ලෙස 2010.03.24 දින භාණ්ඩ මිලට ගැනීම සඳහා ලබාගත් රු. 44,000/- පියවීම නොකර 10,376.50 මුදලක් සාවද්‍ය පරිහරණයට යොදා ගැනීම වේ.

මේ සම්බන්ධ පළමුවන පාර්ශ්වය සාක්ෂි දෙමින් 2010.03.24 දින රු. 44,000/- ලබාගත් බවත් අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු. 47,000/- ක වියදම් කළ බවත් (49 පිටුව) ප්‍රකාශ කරයි. රු. 28,150/- ක මුදලක් ආපසු තැන්පත් කළ බවත්, (50 පිටුව) ප්‍රකාශ කරයි. මෙහි දී මතුවන ගැටලුව වනුයේ රු. 3,223.60 අමතර වියදම් කළා නම් රු. 28,150/- බැඳිය යුත්තේ ඇයි ද යන්නයි.

චෝදනා පත්‍රයේ සඳහන් පරිදි රු. 10,376.00 මුදලක් තැන්පත් නොකිරීම පිළිබඳ සිය මූලික සාක්ෂියේ දී සඳහන් කර නැති අතර විමර්ශන වාර්තාව ඉදිරිපත් කළ විමර්ශන නිලධාරි ඉන්දික චන්දිමාල් මහතාගෙන් හරස් ප්‍රශ්නවල දී එම සිද්ධිය පිළිබඳ හබ කර නැත.

R 22 අනුව නැවත රු. 28,150/-ක් ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇත. (පැ. 16) 2010.03.24 ලබාගත් රු. 44,000/-ක මුදලක් පියවීම සඳහා 2010.06.14 දින රු. 28,150/- ආපසු තැන්පත් කර ඇත. රු. (R 24) මේ අනුව මාස 2ක කාලය මුදල රඳවාගෙන ඇත. පැ. (2) හා R (2) ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත.

2010.05.02 දින සභාපති ඇමතු ප්‍රධාන ඉංජිනේරු විසින් ලියන ලද ලිපිය කෙරෙහි අවධානය යොමු කළෙමි. (පැය 2 R 25)

"2019.11.30 දින දරන EC/EV/168 දරන තාවකාලික වවුචරය මගින් සිවිල් ඉංජිනේරු එස්. රණසිංහ මහතා විසින් රු. 55,000/- මුදලක් අත්තිකාරම් මුදලක් වශයෙන් ලබාගෙන ඇති අතර එමගින් ඇස්තමේන්තුවට අදාළ නොවන වැලි කියුබ් 1ක් සහ සංස්ථා සිමෙන්ති බෑග් 5ක් මිලයට ගෙන ඉතිරි රු. 46,000/- මුදල I/D 98 No. 287092 දරන A 10 පත්‍රය මගින් ආපසු ගෙවා 2010.01.05 වැනි දින EC/SV/168 වවුචරය මගින් පියවා ඇත. ඉන්පසු වවුචර් ලේඛනයට අනුව 2010.03.16 EC/TV/40 දරන තාවකාලික වවුචරය මගින් නැවතත් රු. 44,000/- අත්තිකාරම් මුදලක් මෙම කාර්ය සඳහා ලබාගෙන ඇති බව පෙනේ. නමුත් මෙම මුදල් මෙතෙක් පියවා ඇති බවට ලේඛනයට අනුව සොයාගත නොහැකි

වී ඇත. එමෙන්ම අදාළ කාර්යය සඳහා මිලයට ගත් ද්‍රව්‍ය ගබඩාවට ලැබී නොමැති බව පෙනී යයි. තව ද මෙම කාර්යය මෙතෙක් නිමකොට නොමැති අතර එහි ඉතිරි කාර්යය සඳහා මුදල් ලබාගැනීම ඉහත තත්ත්වය යටතේ අපහසු වී ඇත.''

ප්‍රධාන සිවිල් ඉංජිනේරු මෙම ලිපිය ලියා ඇත. මෙම තොරතුරු අනුව පළමු පාර්ශ්වය විෂමාචාර ක්‍රියාවල යෙදී ඇති බව අපට තහවුරු වේ.

දෙවන සිදුවීම, 2011.08.03 සිට 2012.04.29 කාලය සඳහා වැඩ තහනමට ලක්වූ කාලය සඳහා නොගෙවන ලද වැටුප් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී ඇතැයි පළමු පාර්ශව ඉල්ලීමක් කරයි.

2010.03.03 වැනි දින ලැලි තොගයක් ප්‍රධාන දොරටුවෙන් රැගෙන යාමට පළමු පාර්ශ්වය තර්ජනය කොට යැවීම් පත්‍ර හා දොරටු අවසර පත් සකස්කොට රැගෙන යාමට අවස්ථාව ලබා දීම, මෙහෙයුම් මැදිරියේ අලුත්වැඩියා කටයුතු සඳහා රු. 56,227/- ඇස්තමේන්තු කර රු. 3,615/- මුදල වැඩිපුර ලබා ගැනීමේ සිද්ධිය සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයට විරුද්ධව මූලික විමර්ශන කර විනය විභාගයක් පවත්වා වැඩ තහනමකට ලක්ව සිටි කාලයට වැටුප් තහනම් කරමින් හා දඩයක් ලෙස දින 07ක වැටුප් අහිමි කරමින් විනය නියෝගය දී ඇත. අහිමි කරන ලද අඩ වැටුප් ලබාගෙන ඇත.

ජොසප් ඩික්සන් මහතාට තර්ජනය කර යැවීම් පත්‍රයක් හා දොරටු අවසර පත්‍රයක් එම්. ඒ. චානුක ජයසේකර මහතාට තර්ජනය කර දෙනිටු අවසර පත්‍රයක් සකස් කිරීමට ඉල්ලුම්කරු කටයුතු කර ඇති බවට චෝදනා ඉදිරිපත් කර ඇත. මෙම චෝදනාව සනාථ කිරීම සඳහා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරු මගින් ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි වී. සිසිර මහතා විසින් කළ විමර්ශන වාර්තාව ඉදිරිපත් කරයි. තර්ජනය කළ බවට සඳහන් චානුක ජයසේකර මහතා ද සාක්ෂි ලබා දී ඇත.

මෙම වාර්තාව සිසිර මහතා සහ ආරක්ෂක පරීක්ෂක අයි. ඒ. ඩී. නිමල් චන්දන සකස් කර ඇති බව සාක්ෂිකරුවන ජයසිංහ ආරච්චිගේ ප්‍රසාද් නිශාන්ත මහතා ප්‍රකාශ කරයි. මෙම විමර්ශන වාර්තාව අනුව (360 පිටුව)

''.................. ගබඩා පාලක සිරිපාල මහතා පැමිණ එහි සේවයේ නියුතු ආරක්ෂක නියාමක ආරියසේන මහතාට දොරටු අවසරපත්‍ර 32888 මගින් 4 × 8 × 1.5 ප්‍රමාණයේ කෙම්පස් ලැලි 20ක් ප්‍රධාන දොරටුවෙන් පිටතට රැගෙන ගොස් නැවත ශ්‍රී ලංගම තුළට රැගෙන නොයේම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකළ බවට වාර්තාවේ සඳහන් බව ප්‍රකාශ කරයි............

............... 2010.03.10 දින 11.25 පැයට පමණ 15-2654 දරන ත්‍රීරෝද රථයේ පිටස්තර පුද්ගලයෙක් වන කේ. මනෝහරන් නැමැති පුද්ගලයෙක් දැව තොගයක් පිටතට රැගෙනයාම සඳහා ප්‍රධාන දොරටුව වෙත පැමිණ දොරටු අවසර පත්‍ර 33106 හා යැවීම් පත්‍ර අංක 96446 යටතේ ලී තොගයක් පිටතට රැගෙන ගොස් ඇත. දොරටු අවසර පත්‍ර නිකුත් කළ අය වශයෙන් ගොඩනැගිලි සැලසුම් ශිල්පී එම්. ඒ. චානුක ජයසේකර මහතා විසින් අත්සන් තබා ඇති බව ද ප්‍රකාශ කරයි. පිටතට රැගෙන ගිය දැව සම්බන්ධව ගබඩා තොග පොතේ පිටු අංක 266, 268 බව සඳහන් කරයි. 2010.03.20 වැනි දින ඉහත දිනට ප්‍රධාන කාර්යාලයට රැගෙන ආ බව සඳහන්ව තිබුණ ද එවැන්නක් ලොග් පොත්වල සටහන්ව නැති බව සඳහන් කරයි.

................. 10 වන කොට්ඨාසයේ තරප්පුව සැකසීම හා ඊට යාබද සිවිලිම ඉදිකිරීම් ලයිට් 3ක් සවිකිරීම හා ඇස්තමේන්තු මුදල රු. 56,224.50 මුදලක් බව ද ඇස්තමේන්තුව මුදලින් රු. 59,843.00ක මුදලක් සිවිල් ඉංජිනේරු මහතා ලබාගෙන ඇති අතර රු. 3,615.50ක මුදලක් අනුමැතියෙන් තොරව ලබාගෙන ඇති බව'' ද ප්‍රකාශ කරයි.

මෙම විමර්ශන වාර්තාව අනුව රණසිංහ මහතා දැව පිටතට ගෙනයාමට කටයුතු කළ බවක් සඳහන් නොවේ.

මෙම විමර්ශන වාර්තාවට ශ්‍රී ලංගම ගබඩා පාලක ප්‍රනාන්දු මහතා, ගොඩනැගිලි සැලසුම් ශිල්ප එම්. ඒ. චානුක ජයසේකර මහතා, ලිපිකරු එච්. ජයන්ති රණසිංහ මහතා, ශ්‍රී ලංගම ගොඩනැගිලි පරිපාලන එස්. ඒ. ඩී. සිරිපාල මහතා, සිවිල් ඉංජිනේරු සුමනදාස රණසිංහ මහතා, පොත් තැබුම්කරු ඩබ්. ජී. නදිරා මහත්මිය යන අයගේ ප්‍රකාශ ඇතුළත් බව කියා සිටී. ගබඩා පාලක ජොසප් ඩික්සන් රෙජිනෝල්ඩ් වන

අයගේ ප්‍රකාශ ද ඇතුළත් බව ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කරයි.
නීතිඥ මහත්මියගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන (371 පිටුව)

ප්‍ර. කවුරුන් විසින් ද නිකුත් කරලා තියෙන්නේ ?

උ. සිවිල් ඉංජිනේරු රණසිංහ

පළමු පාර්ශ්වයේ නියෝජිත මහතාගේ හරස් ප්‍රශ්න වැඩ පිළිතුර දෙමින් (399 පිටු)

ප්‍ර. තමන් මූලික සාක්ෂියේ ද 96446 යැවීම් පත්‍රය රණසිංහ මහතා අත්සන් කර ඇති බව ප්‍රකාශ කර සිටියා. මෙහි කොහේද තියෙන්නේ රණසිංහ මහතා නිකුත් කළ බව ?

උ. ස්වාමිනී, යැවීම් පත්‍රය නිකුත් කිරීමට අංශ ප්‍රධානියාගේ අනුමැතියක් අවශ්‍ය වෙනව එම නිසායි එසේ ප්‍රකාශ කළේ.

ප්‍ර. මේක රණසිංහ මහතා විසින් සහතික කරලා තියෙනවා ද ?

උ. අත්සන් කරලා තියෙනවා ස්වාමිනී, අත්සන පැහැදිලි නැහැ ස්වාමිනි.

402 පිටුව

ප්‍ර. මූලික විමර්ශනයේ දී සනාථ වෙලා තියෙනවා ද මෙය රණසිංහ මහතා යැවීම් පත්‍රය ලිව්වා කියලා

උ. ස්වාමිනි රණසිංහ මහතාගේ අනුමැතිය ඇතිව තමයි නිකුත් කරලා තියෙන්නේ. මේ අනුව සාක්ෂිකරු අනුමානයෙන් සාක්ෂි දී ඇති බව පෙනේ.

දෙවන පාර්ශ්වයේ නීතිඥ මහත්මියගේ මෙහෙය වීම මත නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරු ප්‍රසාද් නිශාන්ත සාක්ෂි දෙමින් (269, 370 පිටුව)

ප. යැවීම් යනුවෙන් ප්‍රකාශ කර සිටියා යැවීම් පත්‍රයක් යනු කුමක් ද ?

උ. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ශ්‍රී ලංගම ආයතනය තුළ යම් භාණ්ඩයක් හෝ යම් දෙයක් රැගෙන යැවීම් පත්‍රය තුළ ආයතනයට පමණක් යවන්න පුළුවන්.

ප්‍ර. යැවීම් පත්‍රයක් පිටස්තර පුද්ගලයෙක් ළඟ තියෙන්න පුළුවන් ද ?

උ. බැහැ

ප්‍ර. යැවීම් පත්‍රයක් නිකුත් කරන්නේ කවු ද ?

උ. ආයතන ප්‍රධානියා විසින්

380 පිටුව

ප්‍ර. දොරටු අවසර පත්‍රයකින් පිටස්තර පුද්ගලයෙක්ට බඩු සමග පිටවීමට අවසර දෙන්න පුළුවන් ද ?

උ. පිටස්තර පුද්ගලයෙකු ආයතනයෙන් බඩු ගෙනයනවානම් මු. 10 පතක් සමඟ ඉදිරිපත් කළ යුතුය.

මෙම දැව මනෝහරන් නැමැති පිටස්තර පුද්ගලයෙක් පිටස්තර වාහනයකින් වෙනත් ආයතනයකට ගෙන ගොස් ඇති බව විමර්ශන වාර්තාවේ සඳහන් වේ. ආරක්ෂක නිලධාරි ප්‍රකාශ කර නීති රීති උල්ලංඝනය කරමින් මෙම දැව පිටතට ගෙන යැමක් සිදු වී ඇත. බලයක් නොමැති පුද්ගලයින් විසින් සහතික කරන ලද දොරටු අවසර පත්‍ර හා යැවීම් පත්‍ර උපයෝගී කරගෙන මෙම බඩු යැවීම සිදුකර ඇත. ආරක්ෂක අංශය දැන දැනම මෙය සිදුවී ඇති බව පෙනේ. මෙම වාර්තාව සකස් කර සිසිර මහතා සාක්ෂිවලට කැඳවීමට දෙවන පාර්ශ්වය අසමත් වී ඇත.

තර්ජනය කිරීම පිළිබඳ චානුක ජයසේකර මහතා සාක්ෂි ලබාදේ. දෙවන පාර්ශ්වය නීතිඥ මහත්මියගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

ප්‍ර. කොහොම ද ඔය තර්ජනය ඔබට සිදුකළේ එය කෙටියෙන් අධිකරණ පැහැදිලි කරන්න.
පිටු අංක 416

උ. මම කාර්යාලයේ රාජකාරියක නිරතවෙලා සිටියේ මා හට සිවිල් ඉංජිනේරු මහතා කැඳවීමක් කරන බව දැනුම්දීමත් කළා ඊට පස්සේ මම සිවිල් ඉංජිනේරු මහතාගේ රාජකාරි ස්ථානය වෙත ගමන් කළා. එතන ගබඩා පාලක ප්‍රනාන්දු මහතා රැඳී සිටියා. ඒ අනුව තමයි මෙම පත්‍රිකා සටහන් මට අත්සන් කිරීමට උපදෙස් දුන්නේ.

ප්‍ර. ඒක උපදෙසක් ද නැත්නම් තර්ජනයක් ද ?

උ. ඔහු මට කියා සිටියා අත්සන් කරන්න ක්‍රියා කරන්න.

සාක්ෂිකරු විමර්ශන නිලධාරි ඉදිරියේ තර්ජන කළ බව කියා ඇත. නමුත් මෙදින සාක්ෂිවලදී කියා සිටින්නේ අත්සන් කරන්න කියා සිටි බවත්, මෙම දොරටු අවසරපත් සකස් කිරීමේදීත් යැවීම් පත්‍ර සකස් කිරීමේදීත් තර්ජනය කිරීමෙන් අත්සන් ලබාගත් බව සඳහන් කරන අවස්ථාවේ ගබඩා පාලක ප්‍රනාන්දු මහතා සිටි බව සඳහන් කර ඇත. යැවීම් පත්‍ර අත්සන් කළ ජෝසප් ඩික්සන් රෙජිනොල්ඩ් මහතා සහ ගබඩා පාලක ප්‍රනාන්දු මහතා සාක්ෂිවලට කැඳවා නැත. මේ අනුව තර්ජනය කර අත්සන් ගත්තා යැයි චෝදනාව සනාථ වී නැත. මේ අනුව පළමු චෝදනාව ඔප්පු කිරීමට අසමත් වී ඇත.

2011.09.16 දිනැති චෝදනා පත්‍රයේ (A2) තුන්වන චෝදනාව ඇස්තමේන්තු මුදලට වඩා රු. 3,615.50ක් ලබාගත් බවයි. නමුත් එම මුදලට ගැලපෙන ලෙස බිල් ඉදිරිපත් කර ඇත. ආයතනයට මූල්‍ය අලාභයක් සිදු වූ බවට තහවුරු කර නැත.

විෂමාචාර දෙකක් සිදු වී ඇතැයි චෝදනා ඉදිරිපත් කොට මූල්‍ය විෂමචාරය සම්බන්ධයෙන් එනම් 2009 සිදුකර ඇති ආයතනයේ මුදල් අවභාවිතය සඳහා දී ඇති විනය නියෝගය හා තර්ජනය කර දොරටු අවසරපත් යා යැවීම් පත්‍ර සකස් කිරීම හා ඇස්තමේන්තු මුදලට වඩා බිල් ඉදිරිපත් කිරීම සිද්ධිය සම්බන්ධයෙන් දෙන ලද විනය නියෝග හා සසඳන විට මෙම නියෝගය සාධාරණ නොවන බව සඳහන් කළ යුතුය.

මූල්‍ය අපහරණ චෝදනාවට දී ඇති විනය නියෝගය (2) වන පිටුව

(1) සේවය තහනම් සිටි කාලය නොගෙවන ලද වේතනයෙන් අඩක් අහිමි කිරීම.
(2) අවවාද කිරීම.

දෙවන විනය නියෝගය තර්ජනය කිරීම හා ඇස්තමේන්තු මුදලට වඩා රු. 3,615.50 ක් බිල් ඉදිරිපත් කිරීම. (A4)

(1) නොගෙවන ලද වේතනය අහිමි කිරීම.
(2) මාසයකට සේවය අත්හිටුවීම.
(3) අවවාද කිරීම.

අභියාචනයෙන් පසු (2) වන දඬුවම දින 7ක් වේතනය අහිමි කිරීම් කර ඇත. පළමු නියෝගයට වඩා දෙවන නියෝගය බරපතලය. වරද අනුව පළමුවන සිද්ධිය බරපතලය.

මේ අනුව දෙවන නියෝගයෙන් පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදුවී ඇත. එමෙන්ම මෙම 2011.08.23 - 2012.04.25 දක්වා අහිමි කරන ලද වැටුප සම්බන්ධයෙන් විෂයභාර ඇමතිතුමා වෙත ඉදිරිපත් කළ අභියාචනයෙන් සම්පූර්ණ වැටුප ගෙවීමට එකඟ වී ඇත. කම්කරු දෙපාර්තමේන්තුව කරන ලද පැමිණිලි CE/D/9/5/243/2012 හා 369/2012 ඉල්ලා අස්කර ගෙන ඇත. ඒ පිළිබඳ සමථයක් වූ බව නියෝජ්‍ය මානව සම්පත් නිලධාරියාගේ ශ්‍රී ලංකා/මාසක/කම්/සබ/28/2014 ලිපියෙන් A9 හා (462 පිටුව) තහවුරු වේ. නමුත් සමථය එකඟ වූ පරිදි ක්‍රියාත්මක වී නැත. මේ නිසා පළමු පාර්ශ්වයට අසාධාරණයක් වී ඇත.

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකළ ආරාවුල වනුයේ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ III වන ශ්‍රේණියේ සිවිල් ඉංජිනේරු එස්. රණසිංහ මහතාගේ සේවය 2010.10.25 සිට 2011 පෙබරවාරි දක්වා සහ 2011.08.03 සිට 2012.04.25 දින දක්වා අවස්ථා දෙකකදී අඩ වැටුප් සහිතව වැඩ තහනම් කර පසුව නැවත සේවයේ පිහිට වුවද එම වැඩ තහනම් කළ කාලයට නොගෙවූ අඩ වැටුප් හා උසස්වීම ඇතුළු වෙනත් සහායක් නොලැබීමෙන් ඔහුට අසාධාරණය සිදුවී ඇති ද? එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න වේ.

මෙම ප්‍රශ්නයට පිළිතුර

2010.10.25 සිට 2011/පෙබරවාරි දක්වා වැටුප අහිමි කිරීමෙන් අසාධාරණයක් සිදුවී නැත. මූල්‍ය විෂමචාර මෙම සිද්ධියට බලපා ඇත.

2011.08.03 සිට 2012.04.25 දක්වා කාලයට වැටුප් අහිමි කිරීමෙන් අසාධාරණය සිදුවී ඇත.

උසස්වීම නොලැබීම සම්බන්ධයෙන් අහිමි වූ උසස්වීම කුමක් ද? පළමු පාර්ශ්වය ඉදිරිපත් කර නැත.

අසාධාරණයක් සිදුව ඇත්නම් සහන කවරේද යන්න පහත සඳහන් ප්‍රදානය තීරණය කරමි.

2011/08 සිට 2012.04.25 දක්වා නොගෙවන ලද අඩ වැටුප් පළමු පාර්ශ්වයට ගෙවිය යුතුය.

2011.08.23 සිට 2012.04.25 දක්වා හිමි අඩ වැටුප් පහත පරිදි ගණනය කළෙමි.

| කාලය | අහිමි වැටුප |
|---|---|
| 2011/09 | 11,423.13 |
| 2011/10 | 11,423.13 |
| 2011/11 | 11,423.13 |
| 2011/12 | 11,423.13 |
| 2012/01 | 11,423.13 |
| 2012/02 | 11,423.13 |
| 2012/03 | 14,931.25 |
| 2012/04 | 12,442.71 |
| | 95,912.74 |

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගණකාධිකාරී සහතිකකොට ලකුණු කර ඉදිරිපත් කළ ලේඛන අනුව ගණනය කළෙමි. පළමු පාර්ශ්වයට මෙය විවෘත අධිකරණයේ දී භාරදෙන ලදී.

මෙම මුදල වන රු. 95,912.74 ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළවී මාසයක් ඇතුළත නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත පළමු පාර්ශ්වයට ලබාගත හැකි වන පරිදි දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තැන්පත් කළ යුතුය.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බව සහතික කරමි.

මෙයට,

එච්. ආර්. එල්. සුගතදාස,
බේරුම්කරු.

2023 සැප්තැම්බර් මස 20 වැනි දින.

EOG 11 - 0003

මගේ අංකය: IR/COM/05/2017/100.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.11.11 දිනැති හා අංක 2149/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බදුල්ල, මැද පතන පාර, අංක 13/1 හි පදිංචි චන්ද්‍රානි විජේකෝන් මිය සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 115/2019 හා 2023.09.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

නඩු අංකය : A/115/2019.
ගොනු අංකය : IR/COM/05/2017/100.

චන්ද්‍රානී විජේකෝන් මිය,
අංක 13/1, මැද පතන පාර,
බදුල්ල.

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

**ප්‍රදානය**

ගරු කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් කම්කරු අමාත්‍ය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් අංක IR/COM/05/2017/100 හා 2019 නොවැම්බර් 04 දරන ලිපියෙන් මා පත්කර ඇත.

ආරාවුලට තුඩු වූ කාරණය

ඉහත සඳහන් පාර්ශ්ව අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතා විසින් IR/COM/05/2017/100 හා 2019 ඔක්තෝබර් 22 දින දරන ලිපියේ සඳහන් කර ඇත්තේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවිකාවක වන චන්ද්‍රානී විජේකෝන් මහත්මිය වයස අවුරුදු 57 සම්පූර්ණ වීම මත 2013.10.13 දින සිට විශ්‍රාම ගන්වා 2015.04.20 දින සිට නැවත සේවයේ පිහිටුවීමත් පසු වැටුප් රහිතව සිදු කිරීමෙන් චන්ද්‍රානී විජේකෝන් මහත්මියට අසාධාරණයක් සිදු වී තිබේ ද? අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන මොනවා ද ? යන්න පිළිබඳව වේ.

ආරාවුල සම්බන්ධයෙන් විසඳිය යුතු ගැටළු,

1. අවුරුදු 57 විශ්‍රාම ගැන්වීම සාධාරණ ද?
   බලපෑ චක්‍රලේඛය කුමක්ද ?

2. සේවා දිගුවක් ඉල්ලා තිබේ ද? (පැ. 06 ගොනුව පිටු 25)

3. 2013 අංක 01 චක්‍රලේඛනය පැමිණිලිකාරියට බලපාන්නේ ද? (පැ. 13 පිටු 16)

4. 2015 අංක 01 චක්‍රලේඛයෙහි ආවරණය ඉල්ලුම්කාරියට ලැබේ ද? (පැ. 09 පිටු අංක 31)

අවුරුදු 57 විශ්‍රාම යැවීමේ දී බලපෑ චක්‍රලේඛය අනුව 2013 අංක 01 චක්‍රලේඛය 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන බැවින් ඉල්ලුම්කාරිය විෂයෙහි එම චක්‍රලේඛයෙහි ආවරණය ලැබේ.

දෙවන පාර්ශ්වය කරුණු පැහැදිලි කරමින් 61 පිටුව.

2013 අංක 01 චක්‍ර ලේඛනය 2013.10.15 දින සිට ක්‍රියාත්මක වන බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය එම චක්‍රලේඛය අදාළ කරගෙන ඇත්තේ 2015.03.18 දින බවත්ය. 2013.09.01 දක්වා මෙම චක්‍රලේඛනය ක්‍රියාත්මක කර නැත. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නිකුත් කරන ලද චක්‍රලේඛයක් ඒ ඒ ආයතනවල අභිමතය පරිදි ක්‍රියාත්මක කරන දිනය වෙනස් කළ නොහැකිය.

ඉල්ලුම්කාරියගේ ප්‍රතිඥා ප්‍රකාශනයේ පිටු අංක 11, 3, 4 ඡේද

2013.10.11 දින සේවා නිමාවෙන් අනතුරුව වයස අවුරුදු 57 සම්පූර්ණ වී විශ්‍රාම ගන්වන බව දැනුම් දුන්න ද මෙම දිනය වන විට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව පැ. 03 පිටු අංක 16 අනුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත්කර තිබූ චක්‍රලේඛය මගින් රාජ්‍ය සේවකයන් සංස්ථා මණ්ඩල සේවකයන්ගේ විශ්‍රාම වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කර තිබූ අතර ඒ අනුව චන්ද්‍රානී විජේරත්න මහත්මිය ද විශ්‍රාම ගන්වන වයස අවුරුදු 60 දක්වා දීර්ඝ වියයුතු අතර එම චක්‍රලේඛය ගැන නොසලකා යම් පළිගැනීමක් මත අවුරුදු 57න් විශ්‍රාම ගන්වන ලදී.

ඉල්ලුම්කාරිය වයස 57 ඔබ්බට අවුරුදු 60 දක්වා සේවය කිරීමට ඉඩ ලබාදෙන මෙන් කරන ලද 2013.10.17 හා 2013.11.05 කරන ලද ඉල්ලීම් පැ. 07 පිටු අංක 27, 28 හි ගොනුකර ඇති අතර සේවය අවසන් කිරීම පිළිබඳව 2014.06.23 පැ. 08, පිටු අංක 30 කම්කරු කොමසාරිස් බදුල්ල වෙත ද පැමිණිලිකාරිය පැමිණිල්ලක් කර ඇත.

මෙසේ අසාධාරණ ලෙස විශ්‍රාම ගැන් වූ අයගේ සේවය අවසන් කිරීම අසාධාරණ සහ අයුක්ති සහගත බව බදුල්ල ක.වි.ස. නඩු අංක LT05/20403/2014 නියෝගයෙහි ද 2015.03.26 දක්වා ඇත. පැ. 22 පිටු අංක 98 - 109.

2015 අංක 01 චක්‍රලේඛයේ 2 අනුව විශ්‍රාම වයස 60 දක්වා සේවයේ යෙදිය සිටිය හැකි බව දක්වා ඇති අතර මෙම චක්‍රලේඛයේ 3 අනුව හිඟ වැටුප් රහිතව සේවයේ පුනපත් කිරීම කළ හැකි බැව් දන්වා ඇත. නමුදු මෙම ඉල්ලුම්කාරිය සේවා දිගුවක් ඉල්ලා තිබියදීත් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කර අනුමතික සේවා අවසන් කිරීමත් බව සඳහන් කළ යුතුය. ඒ අනුව පළමු පාර්ශ්වය සේවය අවසන් කිරීම 2013.10.11 දින සිදු කිරීම අසාධාරණ බව තීන්දු කරමි. පැ. 9, 2015 අංක 01, පිටු අංක 31.

මා වෙත යොමු කර ඇති ආරාවුල වනුයේ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවිකාවක වන චන්ද්‍රානි විජේකෝන් මහත්මිය වයස අවුරුදු 57 සම්පූර්ණ වීම මත 2013.10.13 දින සිට විශ්‍රාම ගන්වා 2015.04.20 දින සිට නැවත සේවයේ පිහිටුවීමෙන් පසු වැටුප් රහිතව සිදු කිරීමෙන්, චන්ද්‍රානි විජේකෝන් මහත්මියට අසාධාරණයක් සිදු වී තිබේ ද? පිළිතුර 'ඔව්' යන්නයි.

අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන මොනවාද ? යන්නට පහත සඳහන් ප්‍රදානය තීන්දු කරමි.

2013.10.14 සිට 2015.04.20 දක්වා සේවය අහිමි කළ කාලයට හිඟ වැටුප් ගෙවන ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නියෝග කරමි. පිටු අංක 223 හා පිටු අංක 296 පැය. 25 අනුව හිඟ වැටුපේ සම්පූර්ණ එකතුව 706,518.00 කි. (හත්ලක්ෂ හයදහස් පන්සිය දහඅටකි.)

මෙම මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකර මසක් ඇතුළත අදාළ පාර්ශ්වයට ලබාගත හැකි පරිදි බදුල්ල සහකාර කම්කරු කොමසාරිස් වෙත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් තැන්පත් කළ යුතු යැයි මෙයින් තීරණය කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් බැව් සහතික කරමි.

ඒ. ඒ. සුරවීර,
බේරුම්කරු.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින.
කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

EOG 11 - 0004

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.